ජාතික ගීය ගැන නොකියූ කතාව

මහාචාර්ය
සුනිල් ආරියරත්න

අපට ජාතික ගීයක් මුලින් ම ලැබුණේ 30 දශකයේ ආරම්භයේයි. යටත් විජිත සමයේ දී අපේ ජාතික ගීයක් නොවූ අතර, ඒ වෙනුවට විටින් විට ගායනා කෙරුණේ ජෝර්ජ් නරපතියන්ට නැත්නම් ඉංග්‍රීසි රටේ රජ්ජුරුවන්ට ආශිර්වාද කරමින් ගායනා කරනු ලබන ගීතයි. යටත්විජිත සමයේ දී නිර්මාණය වුණු බොහෝ ගීතවල ජෝර්ජ් නරපතියන්ට ආශිර්වාද කිරීම දකින්ට ලැබුණා. ජෝන් ද සිල්වා වැනි කලාකරුවන් නිර්මාණය කළ නාට්‍ය දර්ශන අවසානයේ ඉංග්‍රීසි රජ්ජුරුවන්ට සෞත්පතා ආශිර්වාද කරමින් ගායනා කරනු ලබන ගීත දකින්න ලැබුණා. "පුණ්‍යවන්ත ජෝර්ජ් නරපති නිදුකින් වෙසේවා සිරිත් ලකී" අලකේශ්වර චරිතය රඟන ජෝන් ද සිල්වාගේ නාට්‍යය අවසන් වූයේ මේ ගීතයත් සමඟයි.

අපේ රටේ ගීත රචකයෝ ඉංග්‍රීසි රජ්ජුරුවන්ගෙඅභිෂේක මංගල්‍යය (මොලි මංගල්‍යය) වෙනුවෙනුත් ගීත රචනා කළා. මේ අතරේදී ජාතික ගීය හැටියට භාවිතා වුණේ බ්‍රිතාන්‍ය ජාතික ගීයයි. God Save the King (දෙවියෝ රජතුමාව ආරක්ෂා කරත්වා) කියන ගීතයයි අපේ ජාතික ගීය බවට පත්වුණේ. සමහරු God Save the King යන බ්‍රිතාන්‍ය ජාතික ගීයේ තනුවට සිංහල වචන යොදලත් ගායනා කළා. ඔය අතරේ දී අපේ ම ජාතික ගීයක් රචනා කරන්න ටිමෙවි ජාතික එස්. මහින්ද හාමුදුරුවෝ අවධානය යොමු කළා. ජෝන් ද සිල්වා, සී.ඩබ්.ඩබ් කන්නන්ගර යන මහත්වරුත් අපේ රටට ජාතික ගීයක් රචනා කරන්න උත්සාහ ගත්තා. ඒ නිසා මේ කාලය වෙනකොට අපේ රටේ ජාතික ගී විශාල ප්‍රමාණයක් භාවිතා වුණා. ජාතික ගී වශයෙන් මේ ගී හැඳින්වුවත් නිල වශයෙන් නම් කරපු ජාතික ගීයක් නිබුණේ නැහැ.

මේ අතරතුර 40 දශකයේ මැද භාගයේ දී ආනන්ද සමරකෝන් "නමෝ නමෝ මාතා" කියන ගීතය රචනා කළා. 1946 දී මෙම ගීතය HMV ග්‍රැමෆෝන් තැටියකට ආනන්ද සමරකෝන් ඇතුළත් කළා. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම නිමිත්තෙන් ජාතික ගී තරඟයක් පවත්වන්න ලංකා ගාන්ධර්ව සභාව තීරණය කළා. 1936 දී පිහිටුවා ගත් සංවිධානයක් වූ එය ජාතික ගී තරඟය සංවිධානය කළා. විනිශ්චය මණ්ඩලයේ එස්.එල්.බී කපුකොටුව, එල්.එල්.කේ ගුණතුංග, දයානන්ද එදිරිසිංහ, පී.බී.ඉලංගසිංහ, ඕ.ඒ.ඩී.ඒ විජේසේකර සහ මුදලිඳු ඊ. අබේසේකර යන මහත්වරු කටයුතු කළා. 1948 ජනවාරි 31 වෙනි දා ජාතික ගී තරඟය පැවැත්වුණු අතර සමරකෝන් මහතා HMV තැටියට ගායනා කළ "නමෝ නමෝ මාතා" කියන ගීතයත් ඉදිරිපත් කළා. තරඟයේ දී මේ ගීතය ගායනා කළේ කණ්ඩායමක් විසිනුයි. තරඟය පැවැත්වෙන විට සමරකෝන් විදේශ ගහවෙලයි හිටියේ. නවත් ගීත රාශියක් මේ තරඟයට ඉදිරිපත් වුණු අතර ආනන්ද සමරකෝන් ඉදිරිපත් කරන ලද "නමෝ නමෝ මාතා" කියන ගීතය මෙහි දී පරාජයට පත්වුණා. පී.බී. ඉලංගසිංහ නොතාරිස් රාළහාමි රචනා කරපු "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිම ජය ජය" යන ගීතය මෙම තරඟයෙන් ජයග්‍රහණය ලැබුවා. ලයනල් එදිරිසිංහ මෙම ගීතයේ තනු නිර්මාණකයා වූ අතර ජයග්‍රහණය සඳහා හිමිවුණු රුපියල් දහසක ත්‍යාගයක් ලයනල් එදිරිසිංහ සහ ඉලංගසිංහ නොතාරිස් රාළහාමි අතරේ බෙදී ගියා.

1948 පෙබරවාරි 04 වෙනිදා, අපේ මුල්ම නිදහස් උළෙල පැවැත්වුණු දවසේ ගුවන් විදුලියෙන් විකාශනය වුණේ තරඟයෙන් ජයග්‍රහණය කරන ලද "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිම ජය ජය" ගීතයයි. ඒ ගීතය සම්පූර්ණයෙන්ම මෙසේයි.

"ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා ජය ජය
සිහිලැති ජල දහරා
ගිරිපෙළ තුරුලිය මනහරා
ශ්‍රාස්ත්‍ර කලා ශිල්පාදී විද්‍යා
වීර විකුම් රණශූර මහා කවි
තේජ රාජ, ජනිතා
හින්දු බෞද්ධ මුස්ලිම් ක්‍රිස්තියානි
සමඟිය ජය ගී ගයමු රකිමු පුදමු
ජය ජය දද ලංකා

නමුත් මේ ජාතික ගීය සම්බන්ධයෙන් ජනතාවගෙන් සහ විචාරකයින්ගෙන් නොයෙක් දෝෂාරෝපණ නැගෙන්න පටන් ගත්තා. මේ ගීතය නිර්මාණය කළ පද රචකයාත් තනු නිර්මාපකයාත්, විනිශ්චය මණ්ඩලයේ සිටි නිසා මේ ගීතයේ ජයග්‍රහණය ගැන බොහෝ දෙනෙක් කතා කළේ එතරම් සතුටු සිතකින් නොවෙයි. ඊට පස්සේ මේ ජාතික ගීය ජනතා උද්ඝෝෂණය නිසා අහෝසි වුණා.

1949 පෙබරවාරි 04 වෙනි දා පැවැත්වුණු දෙවන නිදහස් සමරු උළෙලේ දී ගායනා කළේ එවකට ඉතා ම ජනප්‍රියත්වයට පත්වෙලා තිබුණු ආනන්ද සමරකෝන්ගේ "නමෝ නමෝ මාතා" කියන ගීතයයි. දෙවන නිදහස් සමරු උළෙලේ දී මේ ගීය ගායනා කරන්නේ කොළඹ මියුසියස් විද්‍යාලයේ සිසුවියන් විසිනුයි. සිසුවියන්ට ඒ ගීතය පුහුණු කළේ මර්සිලින් ජයකොඩි පියතුමා විසිනුයි.

1950 දී ජාතික කොඩිය නිල වශයෙන් පිළිගත්තා. "නමෝ නමෝ මාතා" කියන ගීතය ශ්‍රී ලංකාවේ ජාතික ගීය විය යුතුයි කියලා කැබිනට් මණ්ඩලයට යෝජනා කළේ එවකට මුදල් ඇමතිධුරය දරු ජේ.ආර් ජයවර්ධන මහතායි. ඒ අනුව 1951 නොවැම්බර් 22 වෙනි දින ආනන්ද සමරකෝන්ගේ "නමෝ නමෝ මාතා" ගීතය ශ්‍රී ලංකාවේ ජාතික ගීය වශයෙන් නිල වශයෙන් පිළිගත්තා.

මෙම පිළිගැනීමත් සමඟ ම ග්‍රැමෆෝන් ගී යුගයට විශාල කිරිතියක්, ගෞරවයක් ලැබෙනවා. මේ ගීතය ග්‍රැමෆෝන් තැටිය හරහා ජනතාව අතර ජනප්‍රියත්වයක් දිනාගෙන සිටීම එයට හේතුවයි. ග්‍රැමෆෝන් තැටි හරහා ගුවන් විදුලියෙනුත් වාදනය වුණු මෙම ගීතය කොයි තරම් ජනප්‍රිය වුණාද කිව්වොත් නාට්‍ය සංදර්ශනයක් හෝ මොන යම් උත්සවයක් අවසානයේ දී "නමෝ නමෝ මාතා" ගීතය ගායනා කරන්න පටන් ගත්තා. මේ ගීය ජාතික ගීය බවට පත්වීමට ජනප්‍රියත්වය බෙහෙවින් බල පෑ අතර ඒ සඳහා ග්‍රැමෆෝන් තැටිය කළ කාර්යභාර්ය අති විශාලයි. එයි ගෞරවය ග්‍රැමෆෝන් ගී යුගයටත් HMV තැටි මුද්‍රාවටත් හිමි වෙනවා. ඒ වගේම ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වතන්ත්‍ර තනු නිර්මාණයක් ඇතුළත් වෙත්තේ මේ ගීතයටයි. මීට කලින් අපට ස්වතන්ත්‍ර තනු නිර්මාණ නිබුණේ නැහැ. අපේ නාඩගම්, නූර්ති, ටීටර් ආදී කලා නිර්මාණවල බොහෝ විට නිබුණේ

40 දශකයේ මැද භාගයේ දී ආනන්ද සමරකෝන් "නමෝ නමෝ මාතා" කියන ගීතය රචනා කළා. 1946 දී මෙම ගීතය HMV ග්‍රැමෆෝන් තැටියකට ආනන්ද සමරකෝන් ඇතුළත් කළා. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම නිමිත්තෙන් ජාතික ගී තරඟයක් පවත්වන්න ලංකා ගාන්ධර්ව සභාව තීරණය කළා. 1936 දී පිහිටුවා ගත් සංවිධානයක් වූ එය ජාතික ගී තරඟය සංවිධානය කළා. විනිශ්චය මණ්ඩලයේ එස්.එල්.බී කපුකොටුව, එල්.එල්.කේ ගුණතුංග, දයානන්ද එදිරිසිංහ, පී.බී.ඉලංගසිංහ, ඕ.ඒ.ඩී.ඒ විජේසේකර සහ මුදලිඳු ඊ. අබේසේකර යන මහත්වරු කටයුතු කළා. 1948 ජනවාරි 31 වෙනි දා ජාතික ගී තරඟය පැවැත්වුණු අතර සමරකෝන් මහතා HMV තැටියට ගායනා කළ "නමෝ නමෝ මාතා" කියන ගීතයත් ඉදිරිපත් කළා. තරඟයේ දී මේ ගීතය ගායනා කළේ කණ්ඩායමක් විසිනුයි. තරඟය පැවැත්වෙන විට සමරකෝන් විදේශ ගහවෙලයි හිටියේ. නවත් ගීත රාශියක් මේ තරඟයට ඉදිරිපත් වුණු අතර ආනන්ද සමරකෝන් ඉදිරිපත් කරන ලද "නමෝ නමෝ මාතා" කියන ගීතය මෙහි දී පරාජයට පත්වුණා. පී.බී. ඉලංගසිංහ නොතාරිස් රාළහාමි රචනා කරපු "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිම ජය ජය" යන ගීතය මෙම තරඟයෙන් ජයග්‍රහණය ලැබුවා. ලයනල් එදිරිසිංහ මෙම ගීතයේ තනු නිර්මාණකයා වූ අතර ජයග්‍රහණය සඳහා හිමිවුණු රුපියල් දහසක ත්‍යාගයක් ලයනල් එදිරිසිංහ සහ ඉලංගසිංහ නොතාරිස් රාළහාමි අතරේ බෙදී ගියා.

1948 පෙබරවාරි 04 වෙනිදා, අපේ මුල්ම නිදහස් උළෙල පැවැත්වුණු දවසේ ගුවන් විදුලියෙන් විකාශනය වුණේ තරඟයෙන් ජයග්‍රහණය කරන ලද "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිම ජය ජය" ගීතයයි. ඒ ගීතය සම්පූර්ණයෙන්ම මෙසේයි.

*"ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා ජය ජය
සිහිලැති ජල දහරා
ගිරිපෙළ තුරුලිය මනහරා
ශ්‍රාස්ත්‍ර කලා ශිල්පාදී විද්‍යා
වීර විකුම් රණශූර මහා කවි
තේජ රාජ, ජනිතා
හින්දු බෞද්ධ මුස්ලිම් ක්‍රිස්තියානි
සමඟිය ජය ගී ගයමු රකිමු පුදමු
ජය ජය දද ලංකා*

නමුත් මේ ජාතික ගීය සම්බන්ධයෙන් ජනතාවගෙන් සහ විචාරකයින්ගෙන් නොයෙක් දෝෂාරෝපණ නැගෙන්න පටන් ගත්තා. මේ ගීතය නිර්මාණය කළ පද රචකයාත් තනු නිර්මාපකයාත්, විනිශ්චය මණ්ඩලයේ සිටි නිසා මේ ගීතයේ ජයග්‍රහණය ගැන බොහෝ දෙනෙක් කතා කළේ එතරම් සතුටු සිතකින් නොවෙයි. ඊට පස්සේ මේ ජාතික ගීය ජනතා උද්ඝෝෂණය නිසා අහෝසි වුණා.

දෙමළ හා හින්දි ගී නතුයි. නැත්නම් ඉන්දියානු සංගීතඥයින් ගෙන්වාගෙන තනු නිර්මාණ කරගත්තා. එනිසා මෙරට ජාතිකයකු ස්වාධීන නතුවක් මුල්වරට ඉදිරිපත් කළේ "නමෝ නමෝ මාතා" ගීතයෙන් නිසා, එයත් වැදගත් වෙනවා. මෙයින් පසු අපේ රටේ සංගීතඥයින්ටත් ස්වාධීන තනු නිර්මාණය කිරීමේ උනන්දුව ඇති වෙනවා. කොහොම නමුත් මුල් කාලයේ ග්‍රැමෆෝන් තැටි සඳහා ඉන්දියානු තනු ආනන්ද සමරකෝන් විසින් කොපි කළ අවස්ථාත් තිබුණා. "ජන සඵ මන අධිපතියෙන්" ග්‍රැමෆෝන් තැටියට නගපු ගීය ඒ සඳහා උදාහරණයක්. නමුත් ඔහු තනු කොපි කළේ මුල් ග්‍රැමෆෝන් ගීත සඳහා පමණයි. නමුත් "නමෝ නමෝ මාතා" කියන ගීතයෙන් පසු ඔහු දිගින් දිගටම කළේ ස්වතන්ත්‍ර නිර්මාණ පමණයි. "නමෝ නමෝ මාතා" ගීතය ජාතික ගීය වශයෙන් පත් කිරීම මෙරටේ ස්වතන්ත්‍ර ගී තනු කලාවට කළ එක් සේවයක් වශයෙන් හැඳින්විය හැකියි.

ආනන්ද සමරකෝන් මේ ගීතය පෙරුම් පුරා රචනා කළ බව 1951 නොවැම්බර් 25 වෙනි ඉරිදා ලංකාදීප පත්‍රයට ඔහු කළ ප්‍රකාශයෙන් ප්‍රත්‍යක්ෂ වෙනවා.

ඉන්දියාවේ හා පුරා කියා සැරිසැරූ දින කිහිපයේ මවිබිමේ සංවේදනය, සෞන්දර්ය, නටබුන්, නරවරයන් මතකයට නැඟීමෙන් පිස්සකු වීමි. ඉන්දියාවේ සිට ලංකාව බලා එද්දී ඒ හැඟීම යළි යළිත් බුර බුරා නැඟුණි. ස්වදේශානුරාග ය පුබුදු කළ හැකි සමුඟ ගීතයක අඩුපාඩුව දැනුණු අතර ටී.බී ජයසුන්දර මහතා එවැනි ගීයක අවශ්‍යතාවය පෙන්නුම් කර දුන්නේය. 1940 ඔක්තෝබර් 20 වෙනිදා සවස ගෙදර ගියෙමි. මගේ දිවයින පිළිබඳව ඇති වූ උදාර සිතිවිලි හා සෞන්දර්ය පිළිබඳ රසික හැඟීම් කෙළවරක් නැත. කල්පනා කළෙමි. ඒ මේ අත ඇවිද්දෙමි. රාත්‍රී 10 පමණ වන විට පහන් නිවා කළුවරේ ම කල්පනා කළෙමි. තරමක නින්දක් ගියත් අඩ සිහිනයකින් පෙනී ගිය පරිදි තනුවක් එයට සරලන පද මාලාවක් සමඟ "නමෝ නමෝ මාතා" ගීය මනසේ සටහන් විණ. පසුදා උදේ එය ලීවෙමි. මෙය ජාතික ගීය ප්‍රබන්ධ වුණු සැටියි.

HMV ග්‍රැමෆෝන් ලේබලයේ WN11 අංකය දරණ තැටිය හැටියටයි "නමෝ නමෝ මාතා" ගීතය ග්‍රැමෆෝන් තැටියට ඇතුළත් වුණේ. "නමෝ නමෝ මාතා" ගීය ජාතික ගීය වශයෙන් තෝරා ගැනීම ග්‍රැමෆෝන් ගීයට කළ ගෞරවයක් වගේම ඊට එරෙහිව නැගුණු සතුරු බලවේග ග්‍රැමෆෝන් යුගයට එල්ල කළ මරු පහරක් වශයෙනුත් හඳුන්වන්න පුළුවන්. ග්‍රැමෆෝන් ගීයට පමණක් නොවෙයි පුද්ගලිකව ආනන්ද සමරකෝන්ටත් මෙම ප්‍රහාරය දියත් කළා.

එදා සිට අද දක්වාම "නමෝ නමෝ මාතා" ජාතික ගීයට අසාධාරණකම් රාශියක් වෙලා තියෙනවා. ගීතය වෙනුවෙන් රජයෙන් පිරිනැමෙන මුදල ආනන්ද සමරකෝන්ට අහිමි වීම පළමු අසාධාරණයයි. 'කුමුදුනී' නමැති ළමා ගී පොතට මේ ගීතය ඇතුළත් වුණු නිසා පොතේ ප්‍රකාශකයා වන පී.කේ.ඩබ් සිරිවර්ධන මහතා ගීතයට හිමි ත්‍යාග මුදල තමාට ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. ආනන්ද සමරකෝන්ට නොව තමාට මේ මුදල හිමි විය යුතු බව ඔහු දිගින් දිගටම සටන් කළා. අන්තිමේ දී ගීතයට හිමි රුපියල් 2500 ක මුදල් පී.කේ.ඩබ් සිරිවර්ධනට හිමි වුණා.

ජාතික ගීය පටන් අරගෙන තිබෙන අකුර සහ ගණ යහපත් නොවන බවත් ඉන් රටට හොඳ ලද දසාවක් උදා නොවන බවත් ඇතැම් පිරිසක් විශාල ප්‍රචාරයක් ගෙන ගියා. එහි ප්‍රතිඵලය වුණේ "නමෝ නමෝ මාතා" කියන ගීතයේ මුල් පද "ශ්‍රී ලංකා මාතා අප ශ්‍රී ලංකා" නමින් වෙනස් කිරීමයි. මේ වෙනස් කිරීම ගැන ආනන්ද සමරකෝන්ට දන්වුවේවත්, ඔහුගෙන් කරුණු විමසීමක්වත් කළේ නැහැ. රජය හා සම්බන්ධ සිටි විවිධ පිරිස්වල ඕනෑ එපාකම් අනුව අත්තනෝමතික විදියට මේ ගීතයේ මුල් පද වෙනස් කළා. එතැන් සිට මේ ගීතය සතුරු බලවේගවලින් බේරා ගැනීමට ආනන්ද සමරකෝන් සටන් වැදුණා. නමුත් ඔහු පරාජය කරමින් සතුරු බලවේග නැගී සිටියා. නමුත් ජාතික ගීය වශයෙන් ආනන්ද සමරකෝන්ගේ ගීය ඉවත් කරලා වෙනත් ගීයක් ඒ සඳහා යොදන්න ඔවුන් උත්සාහ ගත්තත් එය වාර්ථ වුණා. කොහොම නමුත්, කැපීම්, කෙටීම් කරලා ගීතය සමරකෝන් අපේක්ෂා නොකළ අන්දමින් වෙනස් කළා. සමහර අවස්ථාවලදී ගීතය ගායනා නොකර තනුව වාදනය කළ අවස්ථාත් නිබෙනවා. ඒ කාලෙදි එහෙම කරල තියෙන්නේ ආනන්ද සමරකෝන්ගෙන් පළිගැනීමේ වුවමනාවෙනුයි. අවසන් වශයෙන් සිදුවුණේ ගීත සාහිත්‍යයට අපුමාණ සේවයක් කළ ජාතික ගීයේ නිර්මාතෘ ආනන්ද සමරකෝන් නිදිපෙති පානය කර සිය දිවි නසා ගැනීමයි. මේ දිවි නසා ගැනීම සම්බන්ධයෙන් ඔහු කිහිප විටක් ම අනතුරු ඇඟවීම් කරලා තිබුණා. ජාතික ගීයට දිගින් දිගටම අඩමතේවිටම කළොත් තමා දිවි නසා ගන්නා බව ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. ඔහු ඒ පිළිබඳව ව්‍යාකිවයුත්තන්ට දන්වලා තිබුණා. නමුත් කිසිම කෙනෙක් ආනන්ද සමරකෝන්ගේ සහයට පැමිණියේ නැහැ.

ආනන්ද සමරකෝන්ගේ ඛේදවාචකය පියල් විකුම්සිංහ එවකට තිබුණු 'රිවිදින' පුවත්පතට වැකි කිහිපයක් ලියා තිබුණා. මේ ඒ වැකියි.

"සමරකෝන් මැරුවේ නැහ. අපි ඔහු මැරුවෙමු. රජයත් පණ්ඩිතයින් කිහිපදෙනෙකුත් එකතු වී ඔහු අමු අමුවේ මරා දැම්ම. ඔහු මළවුන් අතරේය. අප මරුවන් අතරේය"